සැ.යු. - 2015.06.12 දින පළ වූ අංක 1919 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,920 - 2015 ජුනි මස 19 වැනි සිකුරාදා - 2015.06.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 912 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජූලි මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජුනි මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## මහව ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන කාර්ය මණ්ඩලයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති, ඒ ඒ තනතුරට ඉදිරියෙන් දක්වා ඇති සුදුසුකම් සහිත අයගෙන් 2015.07.15 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | සේවක ගණය | තනතුරු ප්‍රමාණය | වැටුප් පරිමාණය |
|---|---|---|---|
| 01. බර වාහන ක්‍රියාකරු | ප්‍රාථමික ශිල්පීය | 01 | 06/2006 - (iv) අනුව - රු. 12, 470 - 10 x 130 - 10 x 145 -10 x 160 - 12 x 170 - රු.18,860 |
| 02. විදුලි කාර්මික | ප්‍රාථමික ශිල්පීය | 01 | 06/ 2006 - (iv) අනුව - රු. 12, 470 - 10 x 130 - 10 x 145 -10 x 160 - 12 x 170 - රු. 18,860 |
| 03. මාර්ග කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන | 02 | 06/2006 - (iv) අනුව රු. 11, 730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 12 x 160 - රු. 17,600 |

02. *මූලික අධ්‍යාපන සුදුසුකම් .— **ප්‍රාථමික ශිල්පීය ගණය :***

*බාහිර අයදුම්කරුවන් .—* අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත් වී තිබිය යුතු ය. (අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 05ක් සමත්විය යුතු ය.)

*අභ්‍යන්තර අයදුම්කරුවන් .—* දැනට මහව ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසැලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතු ය.

*II. ශිල්පීය නිපුණතා .—*

(a) බරවාහන ක්‍රියාකරු තනතුර සඳහා තනතුරේ වාහන රියැදුරු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු ය. (සේවා සහතික මගින් සනාථ කළ යුතු ය.)

(b) බරවාහන ක්‍රියාකරු තනතුරු සඳහා තනතුරේ කාර්ය භාරයට අදාලව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතු ය. (A පන්තියේ රියැදුරු බලපත්‍රයක්)

*III. ප්‍රවීණතා පළපුරුද්ද .—* ITAT සහතිකය හෝ NVQ 4 සහතිකය සමග බරවාහන රියැදුරු වශයෙන් වසර 05ක පළපුරුද්ද තිබිය යුතු ය.

*ශිල්පීය නිපුණතා .—* විදුලි කාර්මික තනතුර සඳහා තනතුරේ කාර්යභාරයට අදාළව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද NVQ 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

*ප්‍රවීණතා පළපුරුද්ද .—* පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්දක් තිබීම. (සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතු ය).

***ප්‍රාථමික ශිල්පීය නොවන :***

*මූලික අධ්‍යාපන සුදුසුකම් .—*

- *(අ)* අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර) ;
- *(ආ)* මෙම බඳවාගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දින එම ප්‍රාථමික ශිල්පීය නොවන තනතුර සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වශයෙන් එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියෙන් අධ්‍යාපන සුදුසුකම් අදාල වේ.

*03. වයස :.-* සියළුම තනතුරු සඳහා අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. දැනට පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.

***දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :***

මෙම ඉල්ලුම්කරු වන ........................................මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ..............................වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින්

හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

________________,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :________________
පදවි නාමය :________________
දෙපාර්තමේන්තුව/ආයතනය :________________
(නිල මුද්‍රාව තබන්න)

04. *වෙනත් සුදුසුකම් ඃ*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතු ය ;
(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතු ය;
(iii) අයදුම්කරුවන්/අයදුම්කාරියන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකිකයන් විය යුතු ය;
(iv) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය;
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය;
(vi) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සනාථ කළ යුතු ය. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් සනාථ කළ යුතු ය.);
(vii) දැනටමත් රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයකු නම් වයස් සීමාව බල නොපවතින අතර, එකී පූර්වාසන්න වසර 05ක් තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය;
(viii) අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය මහව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

05. *අයදුම්පත් එවිය යුතු පිළිවෙළ.*— සියලුම අයදුම්කරුවන් මෙහි පහතින් ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පතක් 2015.07.15 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, මහව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "............................... තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතු ය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනුපිටපත් ඇමිණිය යුතු ය :-

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික;
3. හැඳුනුම්පතේ පිටපතක්;
4. ග්‍රාම නිලධාරී සහතිකය;
5. දැනට මෙම ආයතනයේ සේවයේ නියුක්ත වූවන් නම් සේවා සහතිකය.

එච්. එම්. එම්. බී. හේරත්,
ලේකම්,
මහව ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 27 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

***මහව ප්‍රාදේශීය සභාව***

01. (i) මුලකුරු සමග නම :________________.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :________________.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :________________.
03. ජාතික හැඳුනුම්පත් අංකය :________________.
04. ස්ත්‍රී/පුරුෂභාවය :________________.
05. උපන් දිනයඃ
අවුරුද්දඃ______ මාසයඃ_______ දිනය :_______,
06. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :
අවුරුදු :_______, මාසඃ______, දින :_______,
07. විවාහක/අවිවාහක බව :________________.
08. ජාතිය :________________.
09. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද?එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :________________.
10. අධ්‍යාපන සුදුසුකම්:________________.
11. වෙනත් සුදුසුකම්:________________.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව ඔප්පු වුවහොත් හෝ පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

06-558

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.